මගේ අංකය 8/3/1
නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලය
ගිරිතලේ ව්‍යාපාරය
ජයන්තිපුර
2018.01.18

ව්‍යාපාර කලමනාකරණ කමිටුවේ සියළුම
සාමාජික මහත්ම මහත්මීන් වෙත,

## 2018 - ජනවාරි මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම් වාර්තාව.

2018 ජනවාරි 18 වන දින පෙ.ව 9.30 ට ගිරිතලේ නේවාසික ව්‍යාපෘති කළමනාකරණ කාර්යාලීය රැස්වීම් ශාලාවේදී ජනවාරි මස ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීම පවත්වන ලදි. පැමිණ සිටි සියළු දෙනා ආයතන සංවර්ධන නිළධාරි විසින් පිළිගැනීමෙන් අනතුරුව තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් පසු න්‍යාය පත්‍රයට අනුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදි.

**සහභාගි වූ නිළධාරීන්**

| | |
|---|---|
| 01. පී.ජේ.ආර්.පී. ජයවික්‍රම | ආයතන සංවර්ධන සහකාර - ගිරිතලේ ව්‍යාපාරය |
| 02. වයි.එම්.ඒ.එස්. කරුණාරත්න | සංවර්ධන නිළධාරී - ගිරිතලේ ව්‍යාපාරය |
| 03. ඒ.ආර්.ආර්.එන්.කේ. අලහකෝන් | ප්‍රාදේශීය නිළධාරී - ගො.සේ.ම - නවනගරය |
| 04. එම්.පී.ජී.ඒ. ප්‍රියදර්ශනී මැදඇල | ප්‍රාදේශීය නිළධාරී - ගො.සේ.ම - ගිරිතලේ |
| 05. බී.එම්.එල්.ආර්. මෙන්ඩිස් | ඉංජිනේරු සහකාර - ප්‍රා.වා.ඉ.කා - මින්නේරිය |
| 06. ඊ.එම්.එස්.සී. කුමාර | ඉංජිනේරු සහකාර - ප්‍රා.වා.ඉ.කා - මින්නේරිය |
| 07. එම්.එන්.එෆ්. රිස්මිලා | සංවර්ධන නිළධාරී - ගිරිතලේ ව්‍යාපාරය |
| 08. ඩී.ජී.ඒ මදූෂාන් | සහකාර ඉංජිනේරු - ප්‍රා.වා.ඉ.කා - මින්නේරිය |
| 09. එච්.එම්.ඒ.එස්.එන් බණ්ඩාර | තාක්ෂණික සහයක - ප්‍රා.වා.ඉ.කා - මින්නේරිය |
| 10. අයි.අයි.පී.කේ. අමරසූරිය | ස්ථානභාර කෘෂිකර්ම උපදේශක |
| 11. ඩී.ජී ස්වර්ණා කුමාරි | ස්ථානභාර කෘෂිකර්ම උපදේශක, කෘ.උ.කා - ගිරිතලේ |
| 12. ඩී.අයි.ටී. නිමල් අමරසිංහ | කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 13. බී.ආර්. ඉන්ද්‍රාවතී මැණිකේ | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 14. පී.ආර්.බී. පැලවත්ත | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 15. ඩී.කේ. උපතිස්ස | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 16. ජේ.ඒ රම්‍යලතා ජයසිංහ | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 17. එච්. මල්ලිකා හේරත් | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 18. එච්.එම්.කේ හේරත් | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 19. ආර්.ජී ඉන්ද්‍රානි | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 20. ඩබ්.ජී.එස්.එස්. කුමාරි | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය,නවනගරය |
| 21. ඩබ්.ඒ.එල්. ගයානි වික්‍රමආරච්චි | කෘ.ප.නි.ස. - ගොවිජන සේවා මධ්‍යස්ථානය, ගිරිතලේ |
| 22. අයි.වයි.ජී. රාජපක්ෂ | කෘ.ප.නි.ස - ගොවිජන සේවා මධ්‍යස්ථානය, නවනගරය |

සහභාගි වූ ගොවි නියෝජිතයන්

01. එච්.ඒ.ඩී. ශාන්ත ගුණසේකර | සභාපති - කඩවලවැව ගොවි සංවිධානය
02. බී.එම්. රංජිත් බණ්ඩාර | සභාපති - නාගපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
03. ඩබ්.ඒ. පොඩිරාලහාමි | සභාපති - පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධාන
04. චන්ද්‍රසේන පෙතියාගොඩ | සභාපති - බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය
05. එම්. ලලිතා පෙරේරා | සභාපති - 48 බෙදුම් ඇල ගොවි සංවිධානය
06. එච්.ඒ. අයිවන් සමරවික්‍රම | සභාපති - චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි සංවිධානය
07. එච්.එම්. රණතුංග බණ්ඩා | සභාපති - පැරණි ජනපදය බෙදුම් ඇල ගොවි සංවිධානය
08. යූ. එස් ජෙලාල්දීන් | සභාපති - මුස්ලිම්ගම බෙදුම් ඇල ගොවි සංවිධානය
09. පී.ආර්.ජයරත්න | ලේකම් - 48 බෙදුම් ඇල ගොවි සංවිධානය
10. ආර්.ජී සිරිසේන | ලේකම් - මහසෙන්පුර බෙදුම් ඇල ගොවි සංවිධානය
11. ආර්.එම්. ජයවර්ධන බණ්ඩා | ලේකම් - අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය
12. ආර්.එම්.පී. රත්නායක | ලේකම් - විජය බෙදුම් ඇල ගොවි සංවිධානය
13. ඩබ්.එච්.එම්.එස්. විජේසුන්දර | ලේකම් - පුරාණ ගිරිතලේගම බෙ.ඇ.ගො. සංවිධානය
14. යූ.එච්. මුදියන්සේ | භාණ්ඩාගාරික - විජය බෙදුම් ඇල ගොවි සංවිධානය
15. වයි.ජී. සිරිවර්ධන | භාණ්ඩාගාරික - අග්බෝපුර බෙදුම් ඇල ගොවි සංවිධානය
16. .වයි.ජී. චන්ද්‍රරත්න | භාණ්ඩාගාරික - පැරකුම් බෙදුම් ඇල ගොවි සංවිධානය
17. ඉන්දික පුෂ්පකුමාර | භාණ්ඩාගාරික - බැදිවැව බෙදුම් ඇල ගොවි සංවිධානය
18. එච්.ඒ.ඩබ්. ලාල් හෙට්ටිආරච්චි | භාණ්ඩාගාරික - උණගලාවෙහෙර බෙ.ඇ.ගො. සංවිධානය
19. එච්.ඒ. පොඩිබණ්ඩාර | භාණ්ඩාගාරික - නාගපොකුණ බෙ.ඇ.ගොවි සංවිධානය
20. එම්.පී.එච්. සරත් කුමාරසිරි | භාණ්ඩාගාරික - චන්දනපොකුණ බෙදුම් ඇල ගොවි
21. ආර්. ඒ. රූපසිංහ | භාණ්ඩාගාරික - පුරාණ ගිරිතලේ බෙ.ඇ.ගො සංවිධානය
22. ඩී.ආර්. නිලන්ත දසනායක | භාණ්ඩාගාරික - 48 බෙදුම් ඇල ගොවි සංවිධානය

## 01. ලිපි ඉදිරිපත් කිරීම

ආයතන සංවර්ධන නිළධාරි - පී.ජේ.ආර්.පී. ජයවික්‍රම

| ඉදිරිපත් කිරීම | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| වාරිමාර්ග ඉංජිනේරු මින්නේරිය | තඹලවැව 05 ඇළ මගින් ජලය ලබා දෙන ඇළ මාර්ග යටතේ දුම්රිය රක්ෂිත ඉඩම් වලට ජලය ලබා ගැනීම | ගොවි සංවිධානය සමග අදාළ ගොවි මහතුන්ගේ එකගතාවය මත කටයුතු සිදු කර ගැනීම | ගො.සං |
| වාරිමාර්ග කළමනාකරණ අංශය | ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය සඳහා ඇතුලත් වීමේ ගාස්තුව හා 2013 – 2017 සාමාජික මුදල් අය කර ගැනීම | අදාල හිඟ මුදල් කඩිනමින් ගෙවීම | ඒකාබද්ධ ගො.සං |
| ගොවි ජන සේවා ප්‍රාදේශීය නිළධාරි - ගිරිතලේ | 39 පුරාණගම කෘ.ප.නි.ස කොට්ඨාශයේ පලුගහ වත්ත නම් අක්කර 2 ½ පමණ වන කුඹුරු ඉඩමට ජලය ලබා ගත හැකි බවට තහවුරු කිරීම | මෙම කුඹුරු ඉඩම සඳහා 2015 යල කන්නය දක්වා පොහොර සහනාධාරය ලබා වගා කටයුතු සිදු කර ඇති බැවින් ලිපිය ලැබීම. | ගො.සං. |
| R - ගාමිණී අංක 437 තඹලවැව ජයන්තිපුර | කුඹුරු අංක 431 – 432 ට යාම සඳහා මාර්ග පහසුකම් අවහිර වී තිබීම. | මාර්ග පහසුකම් යථා තත්වයට පත් කර ඇත | ගො.සං |

- මෙවර දිස්ත්‍රික් ඒකාබද්ධ ගොවි සංවිධාන රැස්වීම ගිරිතලේ නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලයේ පැවැත්වීමට නියමිත බවත්.
- ගිරිතලේ ව්‍යාපාර කාර්යාලයේ ඉදි වන ආදර්ශ සම්පත් පුහුණු මධ්‍යස්ථානයේ ඉදිරි වැඩ ගොවි සංවිධාන වෙත කොටස් කර ලබා දී ඇති බවත් තම තමන්ගේ කොටස් නඩත්තු කිරීම සඳහා සෘජු දායකත්වය ලබා දෙන ලෙසත් දන්වන ලදි.

## 01. ආයතන සංවර්ධන කටයුතු.

| 1. අනු අංකය | 2. ගොවි සංවිධානයේ නම | 3. වාර්තා කරන මාසය තුළ මහා සභා රැස්වීම පවත්වන ලද දිනය | 4 වාර්තා කරන මාසය | | 5. වාර්තා කරන මාසය තුළ කාරක සභා රැස්වීම පවත්වන ලද දිනය | 6. වාර්තා කරන මාසය තුළ ගිණුම් යාවත් කිරීම | 7. වාර්තා කරන මාසය තුළ අවසන් ගිණුම් සකස් කිරීම | 8. වාර්තා කරන මාසය තුළ ගිණුම් විගණනය කිරීම | 9 ගොවි සංවිධාන මූල්‍ය වත්කම | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | පැවැත් වූ දිනය | සහභාගී වූ සංඛ්‍යාව | | | | | අත ඉතිරිය | බැංකු තැන්පත් |
| 1 | මුස්ලිම්ගම | | | | 2017.12.13 | ✓ | | | 11,527.00 | 89,423.11 |
| 2 | පුරාණ ජනපදය | 2017.12.09 | | | 2017.12.05 | ✓ | | | 3,267.00 | 327,751.17 |
| 3 | ගිරිතලේගම | | | | | ✓ | | | 12997.00 | 206,092.76 |
| 4 | අග්බෝපුර | | | | 2017.12.13 | ✓ | | | 2,608.50 | 232,759.00 |
| 5 | මහසෙන්පුර | | | | 2017.12.15 | ✓ | | | | 1,060,922.00 |
| 6 | ජයන්තිපුර | | | | 2017.12.15 | ✓ | | | 5,000.00 | 274,707.54 |
| 7 | සමගි | | | | 2017.12.10 | ✓ | | | 10,844.90 | 147,668.38 |
| 8 | විජය | | | | 2017.12.17 | ✓ | | | 7,280.25 | 288,805.31 |
| 9 | බැදිවැව | | | | 2017.12.17 | ✓ | | | 50,600.00 | 536,830.53 |
| 10 | කඩවලවැව | | | | 2017.12.13 | ✓ | | | 0.00 | 958,930.17 |
| 11 | පැරකුම් | | | | | ✓ | | | 27,372.00 | 271,044.82 |
| 12 | නාගපොකුණ | | | | 2017.12.04 | ✓ | | | 14,807.85 | 300,176.24 |
| 13 | චන්දනපොකුණ | | | | 2017.12.07 | ✓ | | | 122,670.50 | 266,856.04 |
| 14 | 48 | | | | 2017.12.15 | ✓ | | | 12447.00 | 88,938.45 |
| 15 | උණගලාවෙහෙර | | | | 2017.12.04 | ✓ | | | 7,326.00 | 707,777.22 |
| 16 | ව්‍යාපාර ගොවි සංවිධානය | | | | 2017.12.07 | ✓ | | | 4,570.50 | 14,875.20 |
| 16 | ව්‍යාපාර ගොවි සංවිධානය | | | | 2017/11/22 | ✓ | | | 4570.50 | 14875.20 |

සංවර්ධන නිලධාරී වයි.එම්.ජ්.එස් කරුණාරත්න

- 2018 වර්ෂයේ ගොවි සංවිධාන වල පැවැත්වීමට නියමිත මාසික කාරක සභා කාල රාමුවට අනුව ඉදිරියේදී පවත්වන ලෙසට දැනුවත් කිරීම සිදු කළ බවත්
- 2017 ගිණුම් වර්ෂය සඳහා ගොවි සංවිධාන සතු සියළුම ගිණුම් පොත්පත් බාහිර විගණනයට ලක් කළ යුතු බවත්.
- 2018 වර්ෂය තුළ පැවැත්වීමට නියමිත ගොවි සංවිධාන නිලවරණ කටයුතු සාර්ථකව සිදු කිරීමට අවශය සහය ලබා දෙන ලෙසත්

2018 වාර්ෂික ක්‍රියාත්මක සැලැස්ම අනුමත කිරීම

යෝජනා කළේ :- ගරු සභාපති - නාගපොකුණ ගොවි සංවිධානය
ස්ථිර කළේ :- ගරු සභාපති - 48 ගොවි සංවිධාන

03. නඩත්තු හා මෙහෙයුම් කටයුතු

ඉංජිනේරු සහකාර - මින්නේරිය

- 2018.01.08 දින වන විට ජලාශයේ ජල ධාරිතාවය අක්කර අඩි 8860.07 ක් බවත්.
- මේ වන විට දියබෙදුම හරහා ජලාශයට ජලය ලබා ගත හැකි බවත්.
- දැනට පවත්නා දේශගුණික තත්වය සැලකිල්ලට ගෙන ඉදිරියේදී මනා ජල කළමනාකරණයක් සිදු කරලීමට ගොවි සංවිධාන සහයෝගය ලබා දෙන ලෙසත්.
- ගොවි සංවිධාන වෙත වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන නඩත්තු මුදල් චෙක්පත් ගොවි සංවිධාන වෙත ලියා අවසන් කර ඇති බවත් ඒවා කඩිනමින් ලබා ගන්නා ලෙසත් 2018.01.29 වන විට එම චෙක්පත් කාලය අවසන් වන බවත්.

04. ගොවි ජන සේවා දෙපාර්තමේන්තුව

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී - ගිරිතලේ

1. 2017/18 මහ කන්නය පොහොර සහනාධාරය සඳහා මුදල් ලබා දීම

| අනු අංකය | බැංකුව | කුඹුරු ඉඩම් ප්‍රමාණය ( හෙක්.) | ගොවීන් සංඛ්‍යාව | නිර්දේශිත මුදල ( රු. ) |
|---|---|---|---|---|
| 01 | ලංකා බැංකුව | 1594.75 | 1871 | 19,934,375.00 |
| 02 | මහජන බැංකුව | 660 | 828 | 8,250,000.00 |
| 03 | ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 16.10 | 32 | 201,250.00 |
| 04 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 23 | 23 | 287,500.00 |
| | | 2293.85 | 2754 | 34,425,000.00 |

02. අක්කර බදු අය කිරීම

| | අය කළ හැකි බිම් ප්‍රමාණය ( අක්කර ) | වාර්ෂික ඉලක්කය ( රු. ) | අය වීමේ ප්‍රගතිය 2018.01.18 දිනට ( රු. ) |
|---|---|---|---|
| ගොඩ ඉඩම් | 1269 | 221920.00 | 0.00 |
| මඩ ඉඩම් | 4279 | | |
| එකතුව | 5548 | 221920.00 | 0.00 |

## 03. කාන්තා ගොවි සංවිධාන

i. ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් කාන්තා ගොවි සංවිධාන 41 පිහිටුවා ඇති බවත්.
ii. මේ වන විට කාන්තා ගොවි සංවිධාන සඳහා මාසිකව එක් එක් පුහුණු හා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක වන බවත්.

## 04. නීති කටයුතු

i. අනවසරයෙන් කුඹුරු ඉඩම් ගොඩ කිරීම් හා වෙනත් කාර්යයන් සඳහා පවරන ලද නඩු සංඛ්‍යාව - 01

## 05. ගොවිජන බැංකු නියමු වැඩසටහන 2018 ජනවාරි මසට ප්‍රගතිය

2017 / 18 මහ කන්නය ද්‍රව්‍ය ණය නිකුත් කිරීම.

| ණය වර්ගය | ගොවීන් සංඛ්‍යාව | මුදල ( රු. ) |
|---|---|---|
| ද්‍රව්‍ය ණය | 231 | 7331275.00 |
| රු. 100,000.00 ව්‍යාපෘති ණය | 12 | 885000.00 |
| යන්ත්‍ර ණය | 02 | 538999.00 |
| කෘෂි උපකරණ ණය | 02 | 25000.00 |
| එකතුව | 247 | 8780274.00 |

සාර ලංකා කාබනික පොහොර නිෂ්පාදන දිරි ගැන්වීමේ වැඩසටහන යටතේ ණය නිකුත් කිරීම

| ණය වර්ගය | ගොවීන් සංඛ්‍යාව | මුදල ( රු. ) |
|---|---|---|
| සාර ලංකා ණය | 02 | 200000.00 |

ණය අය වීම්

| ණය වර්ගය | ගොවීන් සංඛ්‍යාව | මුදල ( රු. ) |
|---|---|---|
| වගා ණය | 150 | 4,820,296.00 |
| රු. 100,000.00 ව්‍යාපෘති ණය | 07 | 571,555.00 |
| සාර ලංකා ණය අය වීම් | 01 | 4,077.00 |
| වී සුරැකුම් ණය | - | - |
| කෘෂි උපකරණ ණය | - | - |
| එකතුව | 158 | 4,881,528.00 |

➢ පොහොර සහනාධාර මුදල් ගිණුම්ගත වී නොමැති ගොවි මහතුන් සිටී නම් ඒ පිළිබඳව තමන් දැනුවත් කරන ලෙසත්

ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිළධාරී - නවනගරය

➢ දේශීය ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ පලතුරු ගම්මාන 05 ඇති කිරීමට නියමිත බවත්. එහිදී සමුද්‍රාගමට කටු අනෝදා පැල 500 ක් හා කඩවලවැවට දෙළුම් ලැල 1000 ක් ලබා දීම සිදු කරන බවත්
➢ 2017 / 18මහ කන්නය සඳහා එක් ගොවි මහතකු අක්කර 01කට රු.675ක් ගෙවා රක්ෂණය විය යුතු බවත්

ස්ථාන භාර කෘෂිකර්ම උපදේශක - ගිරිතලේ

- ක්ෂේත්‍රයේ ස්වයං බීජ නිෂ්පාදන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට නියමිත බවත්
- අතිරේක බෝග වැඩසටහන යටතේ 50% දායකත්වයට අක්කර 35 කට බඩ ඉරිඟු බීජ ලබා දී ඇති බවත්
- ගෙවතු වල බදුන් ගත වගාව සඳහා පොලිතීන් බෑග් 3000ක් ලබා දී ඇති බවත්
- වී වගාවේ කෘමි හානි පාලනය කිරීම සඳහා ප්‍රදේශය භාර කෘෂිකර්ම උපදේශක මහතාගේ සහය ලබා ගන්නා ලෙසත්

ස්ථාන භාර කෘෂිකර්ම උපදේශක - නවනගරය

- වී වගාවට පොහොර යෙදීමේදී ගොවීන් ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතු බවත්.
- ටී.එස්.පී පොහොර කුඹුරු වල මඩට යෙදිය යුතු බවත්.
- එම්.ඕ.පී අක්කර 01 සඳහා කිලෝ ග්‍රෑම් 18 පමණ ප්‍රමාණවත් බවත්.
- යූරියා යෙදීමේදී වර්ණ පත්‍ර දර්ශකයට අනුව යොදන ලෙසත්.

| ඉදිරිපත් කළ අය | කාරණය | තීරණය | වගකීම |
|---|---|---|---|
| ගරු භාණ්ඩාගාරික බැදිවැව බෙදුම් ඇළ ගොවි සංවිධානය | තම ගොවි සංවිධාන බල ප්‍රදේශය තුළ ගොවීන් පොහොර භාවිතය පිළිබඳ නිසි දැනුවත් වීමක් නොමැති බවත් | පවතින ගැටලු පරීක්ෂා කර ඉදිරියේදී දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම හා ගොවි සංවිධාන කාරක සභාව දැනුවත් කිරීම | කෘ.දෙ |
| ගරු සභාපති චන්දනපොකුණ බෙදුම් ඇළ ගොවි සංවිධානය | දැනට ගොයම් වගාවේ පැළ මැක්කා හානිය හා දිලීර රෝග වැළඳී ඇති බවත්. | අදාළ ස්ථාන පිළිබඳ තොරතුරු කෘෂි උපදේශකවරුන්ට ලබා දීම හා ඒවා පරීක්ෂා කිරීම | කෘ.දෙ |
| ගරු සභාපති පැරණි ජනපදය බෙදුම් ඇළ ගොවි සංවිධානය | ප්‍රධාන ඇළේ ජලය ගෙන යාමේ අපහසුතාවයක් පවතින බවත් | ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදු කර ඉදිරියේදී අවශ්‍ය කටයුතු කර දෙන බව | වා.දෙ |
| ගරු සභාපති කඩවලවැව බෙදුම් ඇළ ගොවි සංවිධානය | D 06 – 01 ඇලෙහි ජලය නිකුත් කරන දිනවල සම්පූර්ණයෙන් ජලය ලබාදෙන ලෙසත් | ගොවි සංවිධාන වෙත ජලය ලබා දෙනු ලබන කාලය තුළ අවශ්‍ය පරිදි කටයුතු සිදු කිරීම | ගො.සං |
| | කඩවලවැවෙහි ප්‍රධාන සොරොව්ව හා බැම්ම අබලන්ව ඇත | ඒ පිළිබඳ අදාළ කටයුතු සිදු කරන බව | වා.දෙ |
| | වැව් වල රක්ෂිත මායිම් ආරක්ෂා කර ගැනීම සඳහා සුදුසු වැඩපිළිවලක් අවශ්‍ය බව | ඒ පිළිබඳ අදාළ නිලධාරීන් සමග සාකච්ඡා සිදු කර විසඳුම් ලබා දෙන බවත් | වා.දෙ |

| | | | |
|---|---|---|---|
| ගරු සභාපති මුස්ලිම්ගම බෙදුම් ඇළ ගොවි සංවිධානය | 2017 සංවර්ධන ව්‍යාපෘති වැඩසටහන යටතේ කෘෂි පාරවල් සංවර්ධනය කිරීම මන්දගාමීව සිදු වන බව | අදාළ නිළධාරීන් දැනුවත් කරන බවත් | වා.දෙ |
| ගරු භාණ්ඩාගාරික බැදිවැව බෙදුම් ඇළ ගොවි සංවිධානය | ඉලුක්පිටිය වැවට ජලය අනවසරයෙන් ලබා ගන්නා බව | ඉලුක්පිටිය ගොවි සංවිධාන නිළධාරීන් දැනුවත් කර නීත්‍යානුකූලව ජලය ලබා දීමේ වැඩපිළිවළක් සැකසීම සුදුසු බව | වා.දෙ<br>නෝ.ව්‍යා.කා<br>ගො.සං |
| ගරු භාණ්ඩාගාරික විජය බෙදුම් ඇළ ගොවි සංවිධානය | ගොවි සංවිධාන විසින් ගොවීන්ගෙන් සාමාජික මුදල් හා ගොවි සංවිධාන නියෝජිත මහතුන්ගෙන් නඩත්තු අරමුදල අය නොකරන බවත් | • ඉදිරියේදී ගොවි සංවිධාන අතුරු ව්‍යවස්ථාවට අනුව කටයුතු කළ යුතු බව<br>• කන්න රැස්වීම් තීරණයට අනුව නඩත්තු මුදල් අය කිරීම සිදු කළයුතු බව | ගො.සං |
| ගරු සභාපති කඩවලවැව බෙදුම් ඇළ ගොවි සංවිධානය | ගොවි සංවිධාන නියෝජිත මහතුන්ගේ ස්වේච්චා සේවයට සිදු කරන ලද උපහාරයක් ලෙස නඩත්තු අය කිරීම සිදුනොකරන ලෙසත් ඒ සඳහා සුබසාධන ක්‍රමයක් ගොවි සංවිධාන තුළ ක්‍රියාත්මක විය යුතු බවත්. | ගොවි සංවිධාන 15 හි නිළධාරී මහතුන් දැනුවත් කිරීම | ගො.සං |
| | විජය බෙදුම් ඇල ගොවි සංවිධානයේ හිටපු සභාපතිතුමන්ගේ තෙමස් පූර්ණ පිංකම සදහා ව්‍යාපාරයේ සියළු ගොවි සංවිධාන නිළධාරී මහතුන්ගේ සහය ලබා දෙන ලෙසත් | ගොවි සංවිධාන 15 හි නිළධාරී මහතුන් දැනුවත් කිරීම හා අදාළ සහය ලබා දීම. | ගො.සං |
| | ගොවි සෙත ලොතරයියේ අලෙවි නියෝජිත තම ජාතික ඒකාබද්ධ ගොවි සංවිධානය වෙත ලබා දීමට සාකච්ඡා පවත්වා ඇති බවත් | - | - |
| | ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවට ලැබෙන ප්‍රතිපාදන වලින් 25%ක් මහා වාරි බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා ලබා දෙන ලෙසත් | - | - |

ඵලදායිතාවය ඉහළ නැංවීම හා වාරි පද්ධති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

| | | | |
|---|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව | PEISEIP ව්‍යාපෘතිය යටතේ 48 හා චන්දනපොකුණ බෙදුම් ඇළ ගොවි සංවිධාන වල වාරිමාර්ග යටිතල පහසුකම් පුනරුත්තාපනය පිළිබඳ ව්‍යාපෘති සකසා ඇස්තමේන්තු අනුමත කර ගැනීමට කටයුතු සිදු කර ඇති බවත් | ව්‍යාපාර කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | වා.දෙ |
| ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | PEISEIP ව්‍යාපෘතිය යටතේ<br>➢ 48 බෙදුම් ඇල ගොවි සංවිධානය අලෙවි මධ්‍යස්ථානයක් ඉදි කිරීම<br>➢ චන්දනපොකුණ බෙදුම් ඇළ ගොවි සංවිධානය කමත් අතුරන ලබා දීම<br>යන උප ව්‍යාපෘති 02 සකසා අවසන් බව | ව්‍යාපාර කමිටුවේ අනුමැතිය ලබා ගැනීම | ගො. සං. ගො.සේ. දෙ |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | - | - | - |
| වාරිමාර්ග කළමනාකරණ අංශය | PEISEIP ව්‍යාපෘතිය යටතේ<br>2018 ජනවාරි මාසය තුළ සමගි බෙදුම් ඇළ ගොවි සංවිධානය හා විජය බෙදුම් ඇළ ගොවි සංවිධාන වල ඒකාබද්ධ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමට කටයුතු සිදු කරන බවත් | - | - |

2018.01.18 දින පැවති ව්‍යාපාර කළමනාකරණ කමිටු රැස්වීමට පැමිණි සියලු නිළධාරින් සහ ගොවි සංවිධාන වල නියෝජිතයින් හට ආයතන සංවර්ධන නිළධාරි විසින් ස්තුතිය ප්‍රකාශ කරන ලදී.

ඩබ්. ජේ. එස්. ප්‍රියන්ත
නේවාසික ව්‍යාපෘති කළමනාකරු

පිටපත් :-

01. දිස්ත්‍රික් ලේකම් : පොළොන්නරුව - කා. දැ. පි
02. අධ්‍යක්ෂ : වාරිමාර්ග කළමනාකරණ අංශය - කා. දැ. පි
03. දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ : පොළොන්නරුව - කා. දැ. පි
04. ප්‍රාදේශීය ලේකම් : හිගුරක්ගොඩ / තමන්කඩුව - කා. දැ. පි
05. දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ : පොළොන්නරුව - කා. දැ. පි
06. වාරිමාර්ග ඉංජිනේරු : මින්නේරිය - කා. දැ. පි
07. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ : (අන්තර් පළාත්) - කා. දැ. පි
08. ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් : පොළොන්නරුව - කා. දැ. පි